

# බටු කරවිල

ටී. පී. ජී අරුණ යසපාලිත, කෘෂිකර්ම උපදේශක, සේවාගම, පොළොන්නරුව

කරවිල විශේෂ 60 ක් පමණ ලොව පුරා ව්‍යාප්ත වී ඇති අතර බොහෝමයක් එවා ඉන්දියානු කලාපයේ විසිරී ඇත. කරවිල කුකර්බිටේසියේ (Cucurbitaceae) කුලයට අයත් බෝගයක් වන අතර අතර වගාවක් ලෙස වවන විශේෂයන් මෙන්ම වනගතව ස්වභාවිකව වැවෙන විශේෂයන්ද අඩංගුය. ස්වභාවිකව වැවෙන විශේෂ බොහෝමයක් ඉන්දියාවේ දැකිය හැකි අතර ලංකාවේද තුඹ කරවිල හා බටු කරවිල ලෙස ස්වභාවික විශේෂ දෙකක් දැකිය හැකිය.

*Momordica denudata* යන නමින් මෙය පෙර හැඳින්වුවද, සාමාන්‍ය කරවිල වන දර්ශයක් ලෙස ද සමහරු සලකනු ලබයි. ස්වභාවිකව වැඩෙන විශේෂයක් වන මෙය ශ්‍රී ලංකාවට ආවේනිකය. මෙරට වියළි කලාපීය වනාන්තර හා එළි නොකරන ලද බිම්වල මෙන්ම කලාතුරකින් ඇතැම් වතු වලද දැකිය හැකිය. සමහරු තමාගේ පාරිභෝජනයට මෙන්ම අලංකාරයට ද කරවිල වැලක් දෙකක් ගෙවතු වල සිටුවාගෙන ඇති බව දැකිය හැකිය.

තුඹ කරවිල මෙන්ම බටු කරවිල වැලෙහි පත්‍රය සාමාන්‍ය කරවිල වැලක පත්‍ර වල හැඩයට හා වර්ණයට මෙන්ම මල් වල ස්වභාවයටද බෙහෙවින් සමානය. නමුත් ගෙඩියේ ප්‍රමාණය හා හැඩය වෙනස් වේ. බටු කරවිල වැල් සමහරවිට අතුබෙදෙමින් විශාල ප්‍රදේශයක් පුරා පැතිර තිබෙනු දැකිය හැකිය. මෙම වැල සාමාන්‍ය කරවිල




වැල මෙන්ම ඒක ගෘහී වේ. ඵල ගෝලාකාර හැඩයේ සිට තරමක් දිගැටි හැඩය දක්වා විවිධ වේ. ගෙඩියක් සෙන්ටිමීටර් 3 - 7 දිගින් හා සෙන්ටිමීටර් 2.5 - 3.5 පළලකින් යුක්ත විය හැකිය. පිටත ස්වභාවය සාමාන්‍ය කරවිල ගෙඩියකට සමාන වන අතර වර්ණයෙන්ද කොල පැහැයක් ගනී. ඉදුණු පසු තැඹිලි පාටට හැරේ. ඉදෙන විට එහි ඇට වටා ඇති මාංශල කොටස් ද රතු පැහැතිවේ. බීජ, සාමාන්‍ය කරවිල බීජ වලට වඩා මදක් කුඩා නමුත් හැඩයෙන් සමානය. ගෙඩි ඉදුණු පසු යටි පැත්තෙන් පුපුරා ඇට වැටී ප්‍රචාරණය ස්වභාවිකව සිදුවෙමින් පරම්පරාව අඛණ්ඩව පවත්වා ගනී. මෙම කරවිල වල සාමාන්‍ය කරවිල වලට වඩා කෘමි හා රෝග උවදුරු අඩුය.

බටු කරවිල වනගත එළවළුවක් ලෙස අතීතයේ සිට මිනිසුන් භාවිතා කර ඇත. මෙම කරවිල සාමාන්‍ය කරවිල වලට වඩා තිත්ත ගතියෙන් වැඩි වන අතර පෝෂණ ගුණයෙන් මදක් ඉහළය. ඇඹුලක් ලෙස මෙන්ම තෙලෙහි බැද, ආහාරයට ගත හැකිය. බටු කරවිල වල පත්‍ර, ඇට හා මුල් ආයුර්වේද හා දේශීය වෙදකමේදී දියවැඩියාව, අර්ශස් රෝග, පණු රෝග හා සමේ රෝග සඳහා යොදාගනී. ප්‍රතික්ෂුද්‍ර ජීවී කාරක ගුණ ඇත. මෙම කරවිල වැලක් ගෙදර සිටුවා ගැනීමෙන් පසු ජලය පොහොර, කෘමිනාශක යෙදීමෙන් තොරව පහසුවෙන් වගා කරගත හැකි අතර වැලට හානියක් නොවේ නම් තම පරම්පරාව ද අඛණ්ඩව රැකගනී. මේ නිසා ඔබට දිගින් දිගටම අස්වැන්න ලබාදෙන මෙවැනි වටිනා ශාකයක් ඔබේ ගෙවත්තේද සිටුවා ආහාරයට ගෙන ඔබත් නිරෝගී වන්න.